**ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණයන් කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසන් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 (අ), (ආ) සහ (ඇ) ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණු බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සමඟ වූ අංක ACA – 2 (i) ආකෘතියෙහි වැය විෂයය අංක 2401 යටතේ රු.200,000 ක් "පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන" අඩු කිරීමක් ලෙස වාර්තා කර තිබුණද, ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. එසේම ACA – 2(ii) ආකෘතියේ නිවැරදි ඉතිරිය ලෙස දැක්විය යුතු වටිනාකම රු.245,245 ක් වුවත්, දක්වා ඇති වටිනාකම රු.45,245 ක් විය. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | අයවැය චක්‍රලේඛ 05/2019 පරිදි ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් සියයට 10 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අවුරා තබන ලෙස දන්වා ඇත. ඒ අනුව කාර්යමණ්ඩල පුහුණු වැය විෂයයෙන් රු.200,000/- ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අවුරා තබා ඇත. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඉදිරියේදී මු.රෙ.891(1) ප්‍රකාරව ඇප ලේඛණයක් පිළියෙල කර පවත්වාගෙන යාමට කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි. |
| (ආ) **වාහන ලොග් පොත**<br>මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 අකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වා ගත යුතුය. | සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වාගෙන යන ලොග් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී තවදුරටත් නිවැරදිව පවත්වාගෙන යාමට සටහන් කර ගන්නා ලදි. |

(ඇ) **කම්ටු රැස්වීම් වාර්තා**

| | | |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවල රැස්වීම් වාර්තා පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව හා ප්‍රසම්පාදන අත් පොතෙහි 2.11.3 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්තා පවත්වා ගත යුතුය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 හි ආකෘතිය අනුව අදාල වාර්තා පවත්වාගෙන යෑමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

**1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මූල්‍ය හා අභ්‍යන්තර පාලනය සඵලදායී කිරීම සඳහා විටින් විට කාර්ය මණ්ඩල රැස්වීම්හිදි ප්‍රගතිය සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. එම සාකච්ඡාවලදී හඳුනාගත් අභ්‍යන්තර පාලන දූර්වල වියහැකි ස්ථාන ශක්තිමත් කිරීම සඳහා අංක 2018/01, 2018/02, 2018/03, 2018/04, 2019/01,2019/02, 2019/03,2019/04, 2020/01, 2020/02, 2020/03 හා 2020/04 දරණ අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කර ඇත. |

1.6.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | | | |
| (i) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත | ඖෂධ නියැදියක් පමණක් ආනයනය කරන්නේ නම් ආනයන බලපත්‍රයක් ලබාගත යුතු වුවද, රු.11,753,264 ක් වටිනා ඖෂධ එසේ බලපත්‍ර ලබා ගැනිමකින් තොරව ආනයනය කර තිබුණි. තවද, ඖෂධ ආනයනය සඳහා ලබාදී තිබූ ලියාපදිංචි සහතිකයේ වලංගු කාලය ඉක්මවා ගොස් තිබියදී රු.964,897 ක් වටිනා ඖෂධ ආනයනය කිරීමට අවසර ලබාදී තිබුණි. | නෛතික අවශ්‍යතා සොයා බලා කටයුතු කල යුතු අතර එසේ නොකළ නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය පියවර ගත යුතුය. | **2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත**<br><br>ඖෂධ නියදියක් ආනයනයේදී ආනයනය කරනු ලබන ආයතනය විසින් ඒ සඳහා අදාළ ලියවිලි ඉදිරිපත් කර බලපත්‍ර ලබා ගත යුතුය. බලපත්‍රයේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලබා දෙන අනුමැතියේ ආනයනය කළහැකි ඖෂධයේ ප්‍රමාණය සඳහන් නොවේනම් ආනයනය කරන ඖෂධයේ වටිනාකමින් (CIF වටිනාකමින්) 10% නියැදි ප්‍රමාණයක් ආනයනය සඳහා අවසර ලබා දෙනු ලැබේ.<br><br>එසේ වුවද, ඖෂධ නියැදි පමණක් ආනයනය කරන්නේ නම් එම ආයතනය මඟින් ද, උක්ත සඳහන් කළ පරිදි අදාළ ලියවිලි ඉදිරිපත් කර බලපත්‍ර ලබා ගත යුතුය.<br><br>ඖෂධ ආනයනය සඳහා ලබාදී තිබූ ලියාපදංචි සහතිකයේ වලංගු කාලය ඉක්මවා ගොස් තිබියදී ඖෂධ නියාමන අධිකාරිය විසින් අදාල ලියාපදිංචි සහතිකවල මුල් පිටපත් මුද්‍රා තබා ඉන්වොයිස් අංකය හා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය සඳහන් කර ඇත්නම් එම ඖෂධ හර කිරීම සිදු කරනු ලබයි. |
| (ii) | 1987 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 E වගන්තිය | ප්‍රමිතියට පටහැනිව ආනයනයන් සිදු කරනු ලබන ආනයනකරුවන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. | 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 E වගන්තිය ප්‍රකාරව ප්‍රමිතියට පටහැනිව ආනයනයන් සිදු කරනු ලබන ආනයනකරුවන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසිය යුතු වීම. | ආනයන හා අපනයන පාලක ජනරාල්ගේ උපදෙස් පරිදි මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති අංශය විසින් " Import Compulsory List" යටතේ ඇති ආනයනය කරනු ලබන අයිතමයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති හා පිලිවිතර වලට අනුකූලව හා අනුගත විය යුතු බවත් එසේ නොවන ආනයනයන් සඳහා අසාධුගත ලේඛනයක් සකසා එය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කරන ලෙසත් දැනුම් දී ඇත. ඒ අනුව එම ක්‍රියාපටිපාටිය දැනට ක්‍රියාත්මක වී ඇති අතර 2019.01.21 දින ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සඳහා 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා ප්‍රමිති හා පිලිවිතර වලට අනුකූල නොවූ භාණ්ඩ හා ආයතන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවන මෙන් ලිපියක් නිකුත් කර ඇත. මේ වන තෙක් ඒ සඳහා යම් නිශ්චිත ප්‍රතිචාරයක් ලැබී නැති අතර අසාධුගත ලේඛනය සැකසීම හා ගැසට් නිවේදනයක් නිකුත් කිරීමේ රෙගුලාසි ඇතුළත් ගැසට් කෙටුම්පතක් සකස් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | වාහනවල ධාවන සටහන් සෑම මාසයක් අවසාන වී ඊළඟ මාසයේ 15 වන දිනට ප්‍රථමව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ ධාවන සටහන් ඉදිරිපත් කිරීමට දීර්ඝ ප්‍රමාදයක් සිදු වී තිබුණි. | නෛතික අවශ්‍යතා සොයා බලා කටයුතු කල යුතුය. | වාහනවල ධාවන සටහන් ඉදිරියේදී නියමිත කාල වකවානු අනුව විගණකාධිපති වෙත යැවීමට සටහන් කරගත්බව කාරුණිකව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය | 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 04 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයන් සම්බන්ධව 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සඳහන් කර ඇති භාණ්ඩ ආනයනය කිරීමේදී ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍රයක් ලබාගත යුතුය. එහෙත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගමක් විසින් 2017 හා 2018 වර්ෂවල ආනයනය කර තිබූ මි.ර.ගැ වටිනාකම රු.19,760,224 ක් වූ ඝන අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 2,131,325 ක් අඩංගු බහාළුම් 102 ක් සඳහා එලෙස බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කටයුතු කිරීම සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්ය පරිපාටි හෝ වෙනත් ආකාරයෙන් ආනයනකරුවන් කටයුතු කර ඇති බව දැනුවත් වූ වහාම ක්‍රියාත්මක විය යුතුය. | 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය Hayleys Free Zone (Pvt) Ltd විසින් 2017 හා 2018 වර්ෂවල ආනයනය කර ඇති එකී ද්‍රව්‍යයයන් සම්බන්ධයෙන් ඉහත සඳහන් අතිවිශේෂ ගැසට් පත්‍රය අදාල නැත. තවද, 1969 අංක 1 දරන ආනයන හා අපනයන පනතින් හා ඊට සංශෝධන ඇතුළත් 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන ආනයන හා අපනයන පාලන පනත යන පනත්ද ඊට සෘජුව හෝ වක්‍රාකාරයෙන් අදාල නොවේ. Hub Regulation වලට අදාල වන්නේ 2012 අංක 12 දරන මුදල් පනත බව දන්වමි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 වගන්තිය | ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්ම ආකෘතියට අනුව පිළියෙල කර නොතිබුණි. | විධිමත් පරිදි ප්‍රසම්පාදන සැළැස්ම පිළියෙල කල යුතුය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හි සඳහන් ආකෘතිය අනුව අදාල වාර්තා පවත්වාගෙන යෑමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය | 2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 25 ක් අවුරා තැබිය යුතු වුවත්, | 2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. | BD/NS/103/03/18/11 හා 2019 ජූලි 11 දිනැති අප දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශයට යොමු කරන ලද අයවැය දෙපාර්තමේන්තු |

| | | |
|---|---|---|
| | වැය විෂයයන් 03 කට අදාලව එම ප්‍රතිපාදන අවුරා තබා නොතිබුණි. | ලිපිය මගින් චක්‍රලේඛ 4/2019 පරිදි ප්‍රාග්ධන ප්‍රතිපාදන අවුරා තබන ලද ආයතන පිළිබඳ දන්වා ඇත. එම ලිපියේ මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන අවුරා නැත. ඒ හේතුවෙන් ප්‍රාග්ධන වියදම් වලින් 15% ක ප්‍රතිපාදන අවුරා තබා නැත. අයවැය චක්‍රලේඛ 5/2019 පරිදි ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වලින් 10% ක් පමණක් කාර්ය මණ්ඩල පුහුණු වැය විෂයයේ ප්‍රතිපාදන වලින් අවුරා තබා ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 වියදම් කළමනාකරණය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්ථන වැය විෂයයන් 5 කට අදාල එකතුව රු.51,900,000 ක් වූ මූලික ඇස්තමේන්තුව රු.54,682,450 ක් දක්වා සංශෝධනය කර තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 10 සිට සියයට 59 දක්වා වූ පරාසයක පැවතුණි. | තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. | මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර වෙනස්කම් පැවති පහත වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී ප්‍රතිපාදන සංශෝධනය වූ වැය විෂයයන්ගේ වියදම් හඳුනාගෙන නොතිබුණ අතර වර්ෂය තුල සිදුවූ වෙනස්කම් හේතුවෙන් මෙම වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන සංශෝධනය කර ගැනීමට සිදුවිය. එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන සංශෝධනය කර ගැනීමට සිදුවූ හේතුන් පහත දැක්වේ.<br><br>296-1-1-1001, 296-1-1003 :- අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී පවත්නා කාර්ය මණ්ඩලය පදනම් කරගෙන ඇස්තමේන්තු සකසා ඇත. වර්ෂය තුල නව සේවකයින් බඳවා ගැනීම හා නිලධාරින් ස්ථාන මාරුවී පැමිණීම හේතුවෙන් මෙම වැය විෂයයේ ප්‍රතිපාදන වැඩිකර ගැනීමට සිදුව ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | 296-1-1-1101 - 2019 වර්ෂයේ පෙබරවාරි මස සිට ජනාධිපති ලේකම් කාර්යාලය මගින් දිවයින පුරා සංවිධානය කරනු ලැබූ වැඩ සටහන් සඳහා නිලධාරින් සහභාගී කරවිමට සිදුවීම හේතුවෙන් මෙම වැය විෂයයේ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට සිදුවිය. 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සකසන අවස්ථාවේදී මෙවැනි වැඩසටහන් පිළිබඳව වාර්තා කර නොතිබිණි.<br>296-1-1-1201 - අයවැය චක්‍රලේඛ 7/2019 හා 4/2019 පරිදි වියදම් සීමා කිරීම<br>296-1-1-1404 - ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන නොලැබීම |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 5 ක් සඳහා ලබාදී තිබුණ එකතුව රු.6,600,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු4,498,510 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිවීම් රු.2,101,490 ක් වූ අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 37 ක් දක්වා වූ පරාසයක පැවතුණි. | තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. | ඔබගේ විගණන විමසුමේ සඳහන් 296-1-1-1408 යන වැය විෂයය 296-1-1-1409 වැය විෂයය ලෙස සංශෝධනය විය යුතු අතර වැය විෂයන්ගේ දක්වා ඇති ඉතිරිකිරීමේ ප්‍රතිශතය හා එකඟ වේ. |
| (ඇ) | 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශයන් සඳහන් කරමින් නිකුත් කර තිබූ 2018 ජුලි 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 4/2018 මගින් කාර්යසාධනය පදනම් කරගත් අයවැයක් සකස් කිරීම සඳහා අවධාරණය කර තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රජය විසින් නිකුත් කරන චක්‍රලේඛවලට අනුගත වෙමින් ඒ අනුව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂය වෙනුවෙන් අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී දෙපාර්තමේන්තුවේ කාර්ය දර්ශක ලෙස<br>1. ගැසට්පත් මුද්‍රණය කිරීමේ ප්‍රගතිය<br>2. මාර්ගගත පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීම<br>3. එක් සේවකයෙක් වෙනුවෙන් පවත්වන පුහුණු වැඩසටහන් පැය ගණනේ සාමාන්‍යය යනාදිය හඳුනාගෙන තිබුණි. එම දර්ශකයන් ළඟා කර ගැනීමට හැකියාව ලැබෙන පරිදි අයවැය ඇස්තමේන්තු විස්තර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. |

## 2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදායම් අතිරික්තයෙන් තම දෛනික වියදම් පියවීමට තරම් ප්‍රමාණවත් මුදල් සංචිතයක් (දළ වශයෙන් රු.මිලියන 02 ක්) පවත්වාගෙන ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රතිපූර්ණය කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබූ අවස්ථා විය. | මුදල් රෙගුලාසි 177 (1) ප්‍රකාරව ආයතනය විසින් රැස් කරනු ලබන ආදායමින් තම දෛනික වියදම් පියවීමට තරම් ප්‍රමාණවත් මුදල් සංචිතයක් වශයෙන් පවත්වාගෙන ඉතිරි මුදල් හැකිතාක් ඉක්මනින් මහාභාණ්ඩාගාරයට ප්‍රතිපූර්ණය කළ යුතුය. | මෙම දෙපාර්තමේන්තුවේ ලැබීම්වලින් සියයට 95 කට අධික වටිනාකමක් බැංකු අණකරවලින් නියෝජනය වේ. බැංකු අණකර උපලබ්ධිවීම සඳහා දිනයක කාලයක් ගත වන අතර මුදල් පොතේ ශේෂය හා පෙරදින බැංකු ප්‍රකාශනය අනුව මුදල් ශේෂය සසඳමින් භාණ්ඩාගාරය වෙත මුදල් ප්‍රේෂණය කරනු ලැබේ. මේ හේතුවෙන් එක් දිනක උපලබ්ධි නොවූ මුදල් ශේෂයක් දෛනිකව රැඳෙන අතර එම රැඳෙන දෛනික ශේෂය ඉවත් කළ විට ඔබ විසින් දක්වන ලද රු.මිලියන 02 හි රඳවා ගැනීමේ නිර්දේශිත සීමාව 2020 ජනවාරි මස සිට (කොරෝනා අවධිය හැරෙන්නට) සැලකිය යුතු ප්‍රතිශතයකින් ලඟාකර ගෙන ඇත. 2020 ජුනි මස සිට දෛනිකව මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරමින් එම නිර්දේශිත සීමාව ලඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී ඉටු කිරීමට සැළසුම් කල එහෙත් ඉටු නොකළ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණ පහත වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ජාලගත පරිගණක පද්ධතිය පිහිටුවීම | | |
| (i) ICT ආයතනය සමඟ තිබූ අවබෝධතා ගිවිසුම මගින් අදියර 02 ක් යටතේ මෙම ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව පළමු අදියරේදී අපනයනකරුවන් 60 ක් අතුරින් 12 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි. | සැළසුම් කල පරිදි නියමිත දිනට කාර්යය ඉටු කරවා ගැනීමට ක්‍රියාකාරීව මැදිහත්වී අරමුණු ලඟා කරගත යුතුය. | පළමු අදියර දියත් කිරීමෙන් පසු එය ගණුදෙනුකරුවන් විසින් භාවිතා කිරීමේදී ඇති වූ ගැටළු නිරාකරණය කරගැනීම කඩිනමින් සිදුකර ගැනීම සඳහා අප ආයතනය විසින් නිරතුරුව ලිපි මගින් සහ රැස්වීම් මගින් දැනුම් දෙන ලදී. අප ආයතනයට පැමිණෙන ගණුදෙනු කරුවන් ඉතා කාර්ය බහුල හා ව්‍යාපාරික මට්ටමින් කටයුතු කරන පුද්ගලයින් වේ. එම නිසා, ඔවුන් බලාපොරොත්තු වන්නේ කඩිනම් |

| | | | |
|---|---|---|---|
| | | | සේවයක් ලබා ගැනීමටය. පළමු අදියර දියත් කිරීමෙන් පසුව ඔවුන් ඉතා උනන්දුවෙන් පද්ධතිය භාවිතා කිරීමට පෙළඹුනත් ආරම්භයේදී ම පැමිණි ගැටලුකාරී තත්ත්වයන් කඩිනමින් සකස් කර නොදුන් නිසා ඔවුන්ගේ උනන්දුව ක්‍රමයෙන් ගිලිහී ගිය අතර අප ආයතනය වෙත පැමිණ කාර්යයන් ඉෂ්ට කරගන්නා ලදී. මෙයට ප්‍රධානම හේතුව වූයේ නිසි වේලාවට ICTA ආයතනය හා පද්ධති සංවර්ධන ආයතනය විසින් අදාල ගැටලු නිරාකරණය නොකිරීමයි. මේ පිළිබඳව ඔවුන් වෙත දැනුම් දීම් සිදුකර තිබුණද, මේ දක්වා එය ඉටුකර දීමට කටයුතු කර නොමැත. තවද මේ වන විට යාවත්කාලින කළ යුතු දත්ත පළමු අදියරයට ඇතුළත් කල නොහැකි වීමත් ගැටළුවක් වී ඇත. එසේම, අදාල ආයතන මගින් දෙවන අදියර සංවර්ධනය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් සම්පූර්ණ පහසුකම් සහිත ඊ සේවාවක් ගණුදෙනු කරුවන් වෙත ඉක්මණින් ලබා දීමට තිබූ අවස්ථාව මගහැරිණි. |
| (ii) | ඊ - සේවාව මගින් නිර්දේශ ලබා නොගෙන සෘජුවම අදාල ආයතනවලට ගොස් නිර්දේශ ලබා ගැනීමට යොමු වී තිබුණි. | සැළසුම් කල පරිදි නියමිත දිනට කාර්යය ඉටු කරවා ගැනීමට ක්‍රියාකාරීව මැදිහත්වී අරමුණු ලඟා කරගත යුතුය. | ඊ - සේවාව හරහා අයදුම්පත් යොමුකරන ලද ආයතන සඳහා ලබාගත යුතු නිර්දේශ ලියාපදිංචි කරන ලද ආයතන 03 වෙත අයත්ව නොතිබුණි. එසේම, පළමු අදියරේ පැවැති දෝෂ නිරාකරණය කර දී නොතිබුණු බැවින් නිර්දේශ ලබාදෙන ආයතන සමග සෘජුව සම්බන්ධවීම සිදු කිරීමට නොහැකි විය. |
| (iii) | දෙපාර්තමේන්තුව මගින් ආනයන හා අපනයනකරුවන් ඊ - සේවාව වෙත දිරිමත් කිරීමේ ක්‍රමවේදයක් ආයතනය තුළ ස්ථාපිත කර නොතිබුණි. | සැළසුම් කල පරිදි නියමිත දිනට කාර්යය ඉටු කරවා ගැනීමට ක්‍රියාකාරීව මැදිහත්වී අරමුණු ලඟා කරගත යුතුය. | ඊ - සේවාව දියත් කිරීමෙන් පසුව ආනයන කරුවන් රැස්කර දිරිමත් කිරීම් සිදුකළ ද, ඉන් පසුව එහි දී හඳුනාගත් දෝෂ හේතුවෙන් හා ඒවා කඩිනමින් නිරාකරණය කර දීමට ICTA ආයතනය හා අදාල පද්ධති සංවර්ධන ආයතනය අපොහොසත් විය. එමෙන්ම ගෙවීම් සහ බලපත්‍ර/හරපතතනයටපැමිණීමට සිදුවන බැවින් ඇතැම් ආයතන අයදුම්පත්‍ර පමණක් යොමු කිරීමට මැලිවීමක් දක්වනු දක්නට ලැබුණි. (මේ සඳහා අංක i හි පිළිතුරද අදාල වේ.) |

| | | |
|---|---|---|
| (iv) ඊ - සේවාව ලබා දුන්නද ආනයන හා අපනයනකරුවන් මේ සඳහා අනුගත නොවීම මත මෙහි ප්‍රතිලාභය අවම වී තිබුණි. | ආනයන හා අපනයනකරුවන් ආකාර්ශනය කර ගැනීම සඳහා උපායමාර්ග යෙදීම. | ඊ - සේවාව දියත් කිරීමෙන් පසුව ආනයන කරුවන් රැස්කර දිරිමත් කිරීම් සිදුකළ ද, ඉන් පසුව එහි දී හඳුනාගත් දෝෂ හේතුවෙන් හා ඒවා කඩිනමින් නිරාකරණය කර දීමට ICTA ආයතනය හා අදාල පද්ධති සංවර්ධන ආයතනය අපොහොසත් විය. එසේම, ගෙවීම් සහ බලපත්‍ර/හරපතතනයටපැමිණීමට සිදුවන බැවින් ඇතැම් ආයතන අයදුම්පත්‍ර පමණක් යොමු කිරීමට මැලිවීමක් දක්වනු දක්නට ලැබුණි. (මේ සඳහා අංක i හි පිළිතුරද අදාල වේ.) |
| | සැළසුම්ගත පරිදි කාර්යයන් ඉටු කල යුතුය. | පද්ධතියට අදාල සැපයුම්කරුවෙකු තෝරා ගැනීම, වියදම් ඇස්තමේන්තු සකස් කිරීම, උපදේශණ හා තාක්ෂණික දැනුම යන සියළුම කටයුතු ICTA ආයතනයේ මුදල් ප්‍රතිපාදන මත සිදුකළ අතර ඒ සඳහා අප ආයතනය සහභාගිකර නොගන්නා ලදී. |
| (v) 2019 දෙසැම්බර් මාසය වන විටත් දෙවැනි අදියර සඳහා සුදුසු සේවා සැපයුම්කරුවෙකු තෝරා ගෙන නොතිබුණි. | විධිමත් පරිදි තාත්ත්වික පදනමක පිහිටා ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. | පද්ධතියට අදාල සැපයුම්කරුවෙකු තෝරා ගැනීම, වියදම් ඇස්තමේන්තු සකස් කිරීම, උපදේශණ හා තාක්ෂණික දැනුම යන සියළුම කටයුතු ICTA ආයතනයේ මුදල් ප්‍රතිපාදන මත සිදුකළ අතර ඒ සඳහා අප ආයතනය සහභාගිකර නොගන්නා ලදී. |
| (vi) සැලසුම් අදියරේ 11 අදියර සඳහා රු.මිලියන 07 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණද, පසුව එය රු.මිලියන 45 ක් දක්වා වැඩිකර තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව විසින් පැරණි වාහන ගෙන්වීමට අදාලව නිකුත් කරන බලපත්‍ර සම්බන්ධව පසුවිපරමක් සිදු කිරීමේ ක්‍රමවේදයක් නොමැතිවීම. | බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ගැසට් නිවේදනවලට අනුකූලව විය යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කෙරෙන (Debit Note) හර සටහන් ඉදිරිපත් වූ පසු වාහන නිදහස් කිරීම රේගු දෙපාර්තමේන්තුව මගින් සිදු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. එසේ හර සටහන් නොමැතිව වාහන නිදහස් කිරීම පිළිබඳව විමසීමක් හෝ දැනුම් දීමක් රේගු දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොමැත.<br><br>තවද ආනයන හෝ අපනයන පාලන බලපත්‍රයක වලංගු කාලය සාමාන්‍යයෙන් නිශ්චිත කාල පරාසයක් තුළ නිතැතින්ම අවලංගු වී යන බැවින්, බලපත්‍රයක් සඳහා අදාළ ආනයනය සිදු වී ඇති වගට පසුවිපරමක් සිදු නොවේ.<br><br>කෙසේ වෙතත් බලපත්‍රයෙහි සඳහන් අයිතමයන් ආනයනය කරන අවස්ථාවේදී බලපත්‍රය අනිවාර්යයෙන් හර කළ යුතු බවට කොන්දේසියක් (**It is compulsory to debit this license at every instance of importation of goods**.) 2020 ජනවාරි 01 දින සිට සියළුම බලපත්‍ර වල ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඇ) | 2019 වර්ෂයේ නිකුත් කරන ලද ආනයන බලපත්‍ර හා නිකුත් කරන ලද හර නිවේදන සැසඳීමේදී සමහර කාණ්ඩවලට අදාළව නිකුත් කර තිබූ බලපත්‍රවලට වඩා අඩුවෙන් හර නිවේදන නිකුත් වී තිබුණි. මේ සම්බන්ධව පසු විපරමක් සිදු කර නොතිබුණි. | බලපත්‍ර නිකුත් කල පසු ඒවා උපයෝගී කරගෙන සිදු කරන ආනයනයන් පිළිබඳව විධිමත් පරිදි පසුවිපරම් කටයුතු සිදු කල යුතුය. | නිකුත් කරන ලද බලපත්‍ර සියල්ලම හර නොකරන අවස්ථා දක්නට ලැබේ. ඊට හේතුව වන්නේ, ආනයන ක්‍රියාවලිය තුළ සැපයුම්කරුවන් හා ආනයනකරුවන් අතර එළඹෙන ගිවිසුම්ගත බැඳීම් විවිධාකාර අපගමනයනට යටත්වීම තුළ එකී ආනයනය අවලංගු වන අවස්ථා ඇතිවීමයි. එහිදී ආනයනකරුවන් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත එම බලපත්‍ර සඳහා භාණ්ඩ ආනයනය නොකළ බවට තහවුරු කිරීමක් ලබා දෙන්නේ නැත. තවද, ආනයන අපනයන බලපත්‍රයක වලංගු කාලය සාමාන්‍යයෙන් නිශ්චිත කාල පරාසයක් තුළදී නිතැතින්ම අවලංගු වී යන බැවින්, බලපත්‍රයක් සඳහා අදාළ ආනයනය සිදු වී ඇතිද යන වගට පසුවිපරමක් සිදු නොවේ. |

### 3.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 පෙබරවාරි 10 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී සිදුකළ සාකච්ඡාවට අනුව බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු, පසුවිපරම් කාර්ය සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කල යුතු වුවද, එසේ කර නොතිබුණි. | ගිණුම්කාරක සභා නියෝග අනුව විමර්ශන ඒකකය ස්ථාපිත කිරීම. | විමර්ශන ඒකකයක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර සාකච්ඡාවක් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර, පාරිභෝගික සේවා අධිකාරියේ නිලධාරියෙකුගේ සම්පත්දායකත්වය මත එම අධිකාරිය තුළ විමර්ශන ඒකකය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.<br>පාරිභෝගික සේවා අධිකාරියේ හා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පනත් අධ්‍යනය කර, විමර්ශනය කිරීමේ ක්‍රම වේදය සම්බන්ධ පරිපාටිය මේ වන විට සකස් කරමින් පවතින අතර ආනයන හා අපනයන පාලක (පාලන හා ප්‍රතිපත්ති) ගේ අධීක්ෂණය යටතේ ඒකකයක් ස්ථාපිත කර නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් ඒකකය ආරම්භ කිරීමට තීරණය කර ඇත. |

### 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යමණ්ඩලය 104 ක් වූ අතර තථ්‍ය කාර්යමණ්ඩලය 85 ක් වීම හේතුවෙන් පුරප්පාඩු 19 ක් පැවතුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පඩිනඩි කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 43.7 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.514,098 ක් වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට පවතින අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. | පිළිතුර ලබා දී නැත. |